# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2053/10 - 2018 ජනවාරි මස 08 වැනි සඳුදා - 2018.01.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 13/2016

**(357 වන අධිකාරය වූ) යුධ හමුදා පනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව සහ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු (357 වන අධිකාරය වූ) යුධ හමුදා පනතේ 29 වන වගන්තිය සමග කියවිය යුතු 155 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2018 ජනවාරි මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1989 ජුනි මස 15 වන දින අංක 562/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ කලින් කල සංශෝධිත, 1981 යුධ හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 19 වන නියෝගයේ (1) වන ඡේදයේ (අ) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන් :-

''එසේ වුව ද, එකී දුබලතාව හෝ එකී මරණය, යුධ හමුදා සේවාවන් හෝ යුධ හමුදා පනතේ 23 වන හෝ 23 අ වන වගන්ති යටතේ යුධ හමුදා රාජකාරි නොවන ක්‍රියාකාරකම් ඉටු කිරීමේ දී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් සිදු වූවක් බවට යුධ හමුදා වෛද්‍ය මණ්ඩලය විසින් සහතික කර ඇත්නම්, එකී නිලධරයාට හෝ නිලධරයා වෙනුවෙන් ප්‍රදානය කරනු ලබන මුළු විශ්‍රාම වැටුප් ප්‍රමාණය, යුධ හමුදා සේවා විශ්‍රාම වැටුපක් වේ නම්, එම විශ්‍රාම වැටුපද සමග එකතු කළ විට, වාර්ෂික වැටුප් ප්‍රමාණයෙන් 100% නොඉක්මවිය යුතු ය.''.

(2) එහි 28 වන නියෝගයේ (1) වන ඡේදයේ (අ) අනුඡේදයට ඉක්බිතිව පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන් :-

''එසේ වුව ද, එකී දුබලතාව හෝ එකී මරණය, යුධ හමුදා සේවාවන් හෝ යුධ හමුදා පනතේ 23 වන හෝ 23 අ වන වගන්ති යටතේ යුධ හමුදා රාජකාරි නොවන ක්‍රියාකාරකම් ඉටු කිරීමේ දී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් සිදු වූවක් බවට යුධ හමුදා වෛද්‍ය මණ්ඩලය විසින් සහතික කර ඇත්නම්, එකී සෙබලාට හෝ සෙබලා වෙනුවෙන් ප්‍රදානය කරනු ලබන මුළු විශ්‍රාම වැටුප් ප්‍රමාණය, යුධ

1A - G 26908 — 17 (2018/01)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

හමුදා සේවා විශ්‍රාම වැටුපක් වේ නම්, එම විශ්‍රාම වැටුපද සමග එකතු කළ විට, වාර්ෂික වැටුප් ප්‍රමාණයෙන් 100% නොඉක්මවිය යුතු ය.''.

01 - 616/1

---

එල්. ඩී. බී. 13/2016

**(357 වන අධිකාරය වූ) නාවික හමුදා පනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව සහ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ 161 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2018 ජනවාරි මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1991 මාර්තු මස 20 වන දින අංක 654/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සහ කලින් කල සංශෝධිත, 1981 නාවික හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 16 වන නියෝගයේ (1) වන ඡේදයේ (අ) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන් :-

''එසේ වුව ද, එකී දුබලතාව හෝ එකී මරණය, නාවික හමුදා සේවාවන් හෝ නාවික හමුදා පනතේ 21 වන වගන්තිය යටතේ නාවික හමුදා රාජකාරි නොවන ක්‍රියකාරකම් ඉටු කිරීමේ දී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් සිදු වූවක් බවට නාවික හමුදා වෛද්‍ය මණ්ඩලය විසින් සහතික කර ඇත්නම්, එකී නිලධරයාට හෝ නිලධරයා වෙනුවෙන් ප්‍රදානය කරනු ලබන මුළු විශ්‍රාම වැටුප් ප්‍රමාණය, නාවික හමුදා සේවා විශ්‍රාම වැටුපක් වේ නම්, එම විශ්‍රාම වැටුපද සමග එකතු කළ විට, වාර්ෂික වැටුප් ප්‍රමාණයෙන් 100% නොඉක්මවිය යුතු ය.''.

(2) එහි 25 වන නියෝගයේ (1) වන ඡේදයේ, (අ) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන් :-

''එසේ වුව ද, එකී දුබලතාව හෝ එකී මරණය, නාවික හමුදා සේවාවන් හෝ යුධ හමුදා පනතේ 21 වන වගන්ති යටතේ නාවික හමුදා රාජකාරි නොවන ක්‍රියාකාරකම් ඉටු කිරීමේ දී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් සිදු වූවක් බවට නාවික හමුදා වෛද්‍ය මණ්ඩලය විසින් සහතික කර ඇත්නම්, එකී නැවියාට හෝ නැවියා වෙනුවෙන් ප්‍රදානය කරනු ලබන මුළු විශ්‍රාම වැටුප් ප්‍රමාණය, නාවික හමුදා සේවා විශ්‍රාම වැටුපක් වේ නම්, එම විශ්‍රාම වැටුපද සමග එකතු කළ විට, වාර්ෂික වටුප් ප්‍රමාණයෙන් 100% නොඉක්මවිය යුතු ය.''.

01 - 616/2

---

එල්. ඩී. බී. 13/2016

**(359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව සහ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ 29 වන වගන්තිය සමග කියවිය යුතු 155 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2018 ජනවාරි මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1991 ජනවාරි මස 16 වන දින අංක 645/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සහ කලින් කල සංශෝධිත, 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 16 වන නියෝගයේ (1) වන ඡේදයේ (අ) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන් :-

''එසේ වුව ද, එකී දුබලතාව හෝ එකී මරණය, ගුවන් හමුදා සේවාවන් හෝ ගුවන් හමුදා පනතේ 23අ වන වගන්තිය යටතේ ගුවන් හමුදා රාජකාරි නොවන ක්‍රියාකාරකම් ඉටු කිරීමේ දී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් සිදු වූවක් බවට ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලය විසින් සහතික කර ඇත්නම්, එකී නිලධරයාට හෝ නිලධරයා වෙනුවෙන් ප්‍රදානය කරනු ලබන මුළු විශ්‍රාම වැටුප් ප්‍රමාණය, ගුවන් හමුදා සේවා විශ්‍රාම වැටුපක් වේ නම්, එම විශ්‍රාම වැටුපද සමග එකතු කළ විට, වාර්ෂික වැටුප් ප්‍රමාණයෙන් 100% නොඉක්මවිය යුතු ය.''.

(2) එහි 25 වන නියෝගයේ (1) වන ඡේදයේ, (අ) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන් :-

''එසේ වුව ද, එකී දුබලතාව හෝ එකී මරණය, ගුවන් හමුදා සේවාවන් හෝ ගුවන් හමුදා පනතේ 23අ වන වගන්ති යටතේ ගුවන් හමුදා රාජකාරි නොවන ක්‍රියාකාරකම් ඉටු කිරීමේ දී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් සිදු වූවක් බවට ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලය විසින් සහතික කර ඇත්නම්, එකී ගුවන් භටයාට හෝ ගුවන් භටයා වෙනුවෙන් ප්‍රදානය කරනු ලබන මුළු විශ්‍රාම වැටුප් ප්‍රමාණය, ගුවන් හමුදා සේවා විශ්‍රාම වැටුපක් වේ නම්, එම විශ්‍රාම වැටුපද සමග එකතු කළ විට, වාර්ෂික වැටුප් ප්‍රමාණයෙන් 100% නොඉක්මවිය යුතු ය.''.

01 - 616/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.